# වත්සලාගේ නවාතැන

Vathsala



**ඈ යළිත් සිල්පර කොටන් අතරින් ඇවිද ගියේ නිවෙස දෙසටය.... රුහුණු කුමාරි එන්නේ නම් කොතරම් හොඳද? අපෝන්සු අංකල් හැමදාම තමා අත කීයක් හරි තැබූ කාරණය වත්සලාට වැටහෙමින් තිබුණි. තාත්තා අම්මාට කෑ ගසන්නට ඇත්තේද මේ හේතු නිසා වන්නට ඇත.**

හිමිදිරිය වෙනදාට වඩා නැවුම්ය. රන්වන් පාටින් පිපී එන්නට වෙර දරණ හිරුමල පොල් රුප්පාවට එපිටින් වත්සලාට පෙනිණ. දවසක් උදා කරන්නට සොබාදහම කොතරම් වෙහෙසෙනවාද? ඒ සොබා දහම සමඟ ජීවත් වන්නට මිනිසුන් කොතරම් අරගල කරනවාද? දාසය වියැති වත්සලාට මේ පිළිබඳ ලොකු වැටහීමක් නැතත්, හිතට නැගෙන සිතිවිලි හා තර්ක කරන්නට ඈ පුරුදුව සිටියාය. ඉස්කෝලේ දහය පන්තියට සමත් වූ දවස ඈට අද මෙන් මතකය. ඈ ප්‍රගති වාර්තාව ගෙන ගෙට දිව ආවේ මහමෙරක් ලැබුණා වැනි සතුටකිනි.

-මොකද තමුසේ උඩ පැනගෙන....?"

මිදුලේ ලණු අඹරමින් සිටි වත්සලාගේ සොයුරිය ඇසුවේ ඈ දෙස ඔරවා බලමිනි. අක්කාගේ රැවුම් ගෙරවුම් පිළිබඳ මායිම් නොකළ ඕ ගෙට දිව ගියාය. එහෙත් අම්මා පෙනෙන මානයක නැත. ඇය කොහු මෝලට යන්නට ඇතැයි වත්සලා අනුමාන කළාය. එහෙත් තාත්තා මුහුදු යාමට පෙර කීවේ, ගෙයින් එළියටවත් නොයන ලෙස නේද?

-ඔහේනම් කියයි. මේ කෙල්ල ඉස්කෝලේ යන්න ඕන.... ලොකු එකීවත් හැමදාම ගෙදර තියා ගන්නද කල්පනාව......"

අම්මාගේ හඬ නොරිස්සුම් සහගතය. වත්සලා බිය වූයේ වන් විටක පියාගේ ගුටි බැට පූජාවක් ලැබෙන බව ඉඳුරාම දන්නා හෙයිනි. එහෙත් තාත්තා මෙවර කෝප වූයේ නැත.

-දැන් මේ කෙල්ලෝ දෙන්නා ලොකුයි... ඔය විගඩං තියා ගන්න එපා...."

තාත්තාගේ හඬ නිවුණු ස්වරූපයෙන් යුතුවිය. තාත්තා එවන් අයුරින් බැගෑපත් වන්නේ කුමක් නිසාද? චණ්ඩි ජෝසප් ලෙස ගමේ කා අතරත් ප්‍රසිද්ධ තාත්තා මෙතරම් නිවුණු ගති ඇති පුද්ගලයකු බවට පත්වූයේ කෙසේද?

වත්සලා ඒ සිදුවීම සිහිකරමින්ම අක්කා වෙතට ගියාය.

-අම්මා කොහොද ගියේ....?"

-හොයා ගනිං මගෙන් අහන්න එපා...."

-මේ මොකද මේ....?"

අක්කාගේ හැටි දන්නා වත්සලා සුදු ගවුම පිටින්ම පාරට ආවාය. ඕ සිල්පර කොටන් මතින් ඉදිරියට ඇදුනේ අම්මා වැඩ කරන කොහුමෝලට යාමටයි. එහි ගමේ ගෑණුන් හත් අටදෙනෙකුම වැඩ කරන බව ඕ දනී. ඉඳහිට අම්මාට පණිවිඩයක් කියන්නට වත්සලාද එහි ගොස් තිබේ. ඒ සෑම විටකම, එහි හිමිකරුවා වන අපෝන්සු අංකල් කීයක් හෝ තමන් අතමිට මොලවන්නේ ඉස්කෝලෙට ඕනෑ කරන දෙයක් ගැනීමට කියාය.

-අපෝන්සු අංකල් හරි හොඳයි නේද අම්මේ?"

-ඔව්.... දෙවිකෙනෙක් වගේ ...... ඒත් ඒ මිහිහටත් ගෑණු කතන්දර කියනවා......"

-මොනවද කතන්දර....?"

-උඹට ඒ පණ්ඩිතකම් වැඩක් නෑ........."

අතීත සිදුවීමක් වත්සලාට සිහිවිය. ඈතින්, රුහුණු කුමාරිය හූ කියාගෙන පැමිණෙන හඬ ඇසේ. ඕ හනි හනික සිල්පර කොටන් මතින් එහා පසට පැන ගත්තාය. කොහු මෝල පෙනෙන නොපෙනෙන මානයේදී ඇයට ඇසිලින් නැන්දා මුණ ගැසුණි.

-කොහේද කෙල්ලේ යන්නේ .....?"

-අම්මව බලන්න.... මං දහයේ පන්තියට පාස් නැන්දේ...."

-අනේ හොඳයි.... උඹවත් ඒජන්ත විභාගෙට ලියපංකෝ....."

ඇසිලින් කීවේ තම එකම දුව තුන් හතර වතාවක් එකම පන්තියේ සිට අවසානයේ ගෙදර නැවතුණු හෙයිනි. ගමේ කිසිවකුත් හොඳින් ඉගෙන ගන්නවාට ඇය නොකැමැතිය. බොහෝ දුක් ගැහැට වලින් පීඩාවට පත්වෙද්දී මිනිසුන් තුළ ආත්මාර්ථය ඉස්මතු වී එයි. අනුන් නුරුස්සන තැනට පත්වෙයි. පුංචි වුවද වත්සලාට ජීවිතයේ එබඳු තැන් පිළිබඳ වැටහීමක් තිබුණි.

-වත්සලා ළමයා කොහේද මේ...."

ඒ මාග්‍රට් අක්කායි. අම්මාත් සමඟ මාසෙට දෙතුන් වතාවක් රණ්ඩු ඇති කර ගැනීම ඇගේ පුරුද්දයි. ඉන් බොහෝ ගැටලු ඇතිවන්නේ වත්තේ වැට මායිම පිළිබඳ ප්‍රශ්න වලටය.

-අපේ අම්මා කෝ.....?"

-ආං අර පැත්තේ......"

කොහු මෝලේ ඒ වනවිට දෙතුන් දෙනෙකුට වඩා නොවිණි. මාග්‍රට් පෙන්වූ දිශාවට වත්සලා ඇවිද ආවාය.

අම්මා ඉදිරිපස කොටසේ පෙනෙන්නට නොවූයෙන් ඈ කොහු මෝල ඇතුළටම ගියාය. එහි එක් කාමරයක් වැනි කොටසකදී ඈ දුටුවේ අම්මාත්, අපොන්සු අන්කලුත්ය.... ඇය ගල් ගැසුණාක් මෙන් මව දෙස බලා සිටියාය. වත්සලාට කිසිවක්ම අදහාගත නොහැකිවිණි. ඕ ආපිට හැරුණේ හඬා ගෙනය. තමා දහයේ පන්තියට සමත් වී ගිය සතුට මවගේත් අපෝන්සු අංකල්ගේත් ආලිංගන රංගනය දුටු මතින් අතුරු දන්ව ගිය අයුරු......

ඈ යළිත් සිල්පර කොටන් අතරින් ඇවිද ගියේ නිවෙස දෙසටය.... රුහුණු කුමාරි එන්නේ නම් කොතරම් හොඳද? අපෝන්සු අංකල් හැමදාම තමා අත කීයක් හරි තැබූ කාරණය වත්සලාට වැටහෙමින් තිබුණි. තාත්තා අම්මාට කෑ ගසන්නට ඇත්තේද මේ හේතු නිසා වන්නට ඇත.

-පොඩ්ඩියේ...."

ඒ තාත්තායි. වත්සලා මෙතෙක් වූ කල්පනාවෙන් මිදී පියා දෙස බැලුවාය.

-මං වැල්ල පැත්තට යනවා පුතේ.. අම්මා ආවොත් ඉන්න කියපං...."

ඇයට පියා කෙරෙහි දුක සිතිණ. එදා දහය පන්තියට පාස් වූ සතුට කියන්නට ගොස් තමා දුටු දසුන හේතුවෙන් අම්මා එදින සිට ගෙදර පැමිණියේ නැත. වත්සලා දුටු දේ ඕ කාටවත්ම කියා නොතිබුණි. තාත්තා අම්මාගේ ගෙදර නොපැමිණීම පිළිබඳ සිතන්නේ තම අවවාද නොරිස්සු හෙයින් ඕ ගෙදර නොපැමිණි බවය. එහෙත් අපෝන්සු කාරයා පිළිබඳ නරක පුවත් ඕ අනේක වාරයක් අසා තිබුණි.

මේ සිදුවීමත් සමඟ වත්සලාගේ ජීවිතයේ කොතෙක් නම් වෙනස්කම් සිදුවීද? ඕ ගෙදර පැමිණි මොහොතේම ප්‍රගති වාර්තාව ඉරා දැමුවාය. ඇගේ පාසැල් ගමන එතැනින් නතරවිණි. අක්කා ඉන් සති දෙකකට පසු ඇය හාද වී සිටි තරුණයා සමඟ පැනගොස් වෙනමම ජීවත් වෙයි. අම්මා එම සිදුවීමෙන් පසු, තාත්තා ගෙදර නොසිටි වේලාවන් දෙකක නිවසට පැමිණ ගිය අයුරු ඇයට මතකය.

-ඇයි උඹ දැන් ඉස්කෝලේ යන්නැත්තේ?'

අම්මා අසන්නේ විස්සෝප හඬිනි. වත්සලා එවන් විටක කිසිවක් නොකියයි.'

-අපෝන්සු අංකල් කියන්නෙත් උඹට කොහොම හරි උගන්නන්න කියලා...."

-උගන්නන්න කියලා.... මට මතක් කරන්න එපා ඔය වනචරයව....."

-වනචරයෙක් නෙමෙයි ඒ මිනිහා..........."

අම්මා හඬයි. වත්සලා සිත දැඩිකරගෙන ඈත බලා සිටියාය.

-උඹ නොදන්න ගොඩක් කතන්දර තියෙනවා දුවේ....."

-නොදන්න දේවල් නෙමෙයි. අපි ඔක්කොම දන්නවා. ඇයි අපට උගන්වන්න ඔය වගේ වැඩ කරේ...?"

වත්සලාගේ හඬ කෝපයෙන් පිරී ඇත. ඇයට පියාගේ අහිංසක දෑස සිහිවෙයි. බිරිඳක් ලෙස මවක් ලෙස සිය මව යුතුකම් ඉටුකර ඇද්ද? ඇගේ ජීවිතයේ වන නොපැහැදිලි තැන් නිසා අවුල් වී ගියේ ඇය පමණක්ද?

තාත්තා, අක්කා, මෙන්ම තමන්ද ඇය හේතුවෙන් නොයෙකුත් දුක් පීඩාවන්ට මැදිවුණි.

-වත්සලා.... අරකි ආවද....."

වත්සලා තිගැස්සී ගියේ තාත්තාගේ හඬිනි. ඔහු වැල්ල පැත්තට ගියේ මොහොතකට පෙරය. ඒ ගොස් හොඳටම සප්පායම් වී පැමිණ ඇත. වත්සලා කතා නොකළාය.

-මං අද ඕකිව නැති කරනවා... හැමදාමත් ඕකී මට බොරු කළා...."

වත්සලා එබී බැලුවේ චණ්ඩි ජොසප් ලෙස ප්‍රසිද්ධ තම පියාගේ හැසිරීම් රටාව පිළිබඳ හොඳටම දන්නා බැවිනි. ඔහු ඒ වනවිටත් දෙවට දිගේ නොපෙනී ගොස් තිබිණ. ඈ පියා පසුපස දිවගියේ ඔහුගේ ගමන වළකන්නට සිතාගෙනයි. ඔහු අත මාළු කපන පිහියද විය.

-උඹ ගෙදර පලයං...."

යක්ෂාවේශ වී සිටින පියාගේ හැටි දන්නා ඕ ආපසු නිවස දෙසට දිව ගියාය. විනාඩි දහයකට පහලොවකට වඩා ගත නොවුණි. ප්‍රදේශයම ප්‍රකම්පිත කරමින් ඇසුණු කෑගැසිල්ල අම්මාගේ බවට රහසක් නැත. වත්සලා දෙකන් වසා ගත්තාය. ඇයට කිසිවක්ම සිතාගත නොහැකි විය.

-දන්නවද උඹලගෙ තාත්තා කොරල තියෙන හරිය.....?''

මාග්‍රට් අක්කා ගෙට පැන කෑ ගසයි. ඒ ගැන දැන ගන්නට දෙයක් නැත. සිතුවම් පටක් දිග හැරෙන්නා සේ එම සිද්ධි දාමය ඈ ඇස් ඉදිරියේ මැවිණ.

''අනේ උඹලගේ පවුලටත් වෙච්ච දෙයක්.... දැන් ඉතින් උඹලගේ මහ එකාට ලගින්න වෙන්නේ හිරේ තමයි....''

මාග්‍රට් ආපසු දිවයයි. ගමේ ගැහැණු වැල නොකැඩී කොහුමෝල දෙසට දිවයනු පෙනෙයි. වත්සලාට ඒ දෙසට යන්නට තරම් ශක්තියක් නොවිණි. ඈ දෙඇස් වසාගෙන ගෙයි මුල්ලකට වී සිටියාය. පොලිස් ජීප් රියක් පැමිණෙන ශබ්දය ඇයට ඇසුණි.

ඈ ජනෙල් කවුළුව සමීපයට පැමිණ පාර දෙස බැලුවාය. එදා දහයේ පන්තියට තමන් සමත් නොවුණා නම් මොනතරම් හොඳද? එසේ නම් ඒ බව මවට කියන්නට තමා කොහු මෝලට නොයනු ඇත. අම්මාගේත් අපෝන්සු අංකල්ගේත් හැසිරීම නොදකිනු ඇත. අම්මා ගෙදර නොපැමිණියේ එම සිදුවීම තමන් විසින් පියාට කියන්නට ඇතැයි සිතුණ බැවින් විය හැක. කෙසේ හෝ ඇය කොහු මෝලේ නතරවීමෙන් ගමේ වූ කටකතා අලුත් මඟකට පෙරලුණි. මෙය තාත්තාට මහත්ම හිසරදයක් වන්නට ඇත.

එදින රාත්‍රියේ ඇඳුම් කෑලි දෙක තුනකුත් බෑගයකට දමාගත් වත්සලා සිල්පර කොට මතින් ඇවිද ගියාය. ජීවිතය කොතරම් හිස්ද? රුහුණු කුමාරිය අදවත් තමා පිළිගන්නට පැමිණේද? එහෙත් විනාඩි කීපයක් ගෙවියද්දී වත්සලාගේ නෙත ගැටුනේ පල්ලියකි.

ඈ එහි කුරුසය දෙස බොහෝ වේලාවක් බලා සිටියාය. අනතුරුව එහි ගේට්ටුව හැරගෙන ඊට ඇතුළු වූවාය. වත්සලා ඒ වනවිටත් තම ජීවිත දිශාව තීරණය කොට තිබුණි. සියල්ල තුළ පවතින හිස් බව ඇයට පසක් වෙමින් තිබිණ. ඒ හිස් බව, ඈ සෑම උදෑසනකම මෙනෙහි කළාය. ඒ කන්‍යා සොයුරියක පරිද්දෙනි.

**දීපා කරුණාරත්න**